කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
விவசாயத் திணைக்களம்
DEPARTMENT OF AGRICULTURE

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
பீடைகொல்லி பதிவு அலுவலகம்
Office of the Registrar of Pesticides

අංක 1056, ගැටඹේ, තැ.පෙ. 49, පේරාදෙණිය 20400, ශ්‍රී ලංකාව
இல 1056, கெடம்பே, த.பெ.இல 49, பேராதனை 20400, இலங்கை
No. 1056, Getambe, P.O. Box 49, Peradeniya 20400, Sri Lanka

දුරකථන/தொலைபேசி/Telephone : (94)812388076/388135
ෆැක්ස්/தொலைநகல்/Fax : (94)812388135
ඊ මේල්/மின்னஞ்சல்/E-mail : pest@slt.lk
වෙබ්/மின்னஞ்சல்/Web : www.doa.gov.lk

මගේ අංකය / எனது எண் / My No: RP/VIII/$A_1$ | ඔබේ අංකය / உமது எண் / Your No: | දිනය / திகதி / Date: 2020.06.29

<u>චක්‍රලේඛ අංක: **RP/AUO/2020-1**</u>

අධ්‍යක්ෂ
ව්‍යාප්ති හා පුහුණු

පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්
(මධ්‍යම, වයඹ, උතුරුමැද, නැගෙනහිර, ඌව, සබරගමුව, උතුර, දකුණ, බස්නාහිර)

අධ්‍යක්ෂ (කෘෂිකර්ම)
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## පළිබෝධනාශක අලෙවි යාන්ත්‍රණය ක්‍රමවත් කිරීම: ඉදිරි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගනු ලැබ ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මාගේ 2019.03.25 දිනැති චක්‍රලේඛ අංක: RP/AUO/2019-2 වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

02. 1994 අංක 06 හා 2011 අංක 31 දරණ පනත් මගින් සංශෝධිත 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 24අ. (1) වන උප වගන්තිය ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ අනුයුක්ත ආහාර සහ ඖෂධ පරීක්ෂකවරුන් (Food & Drug Inspectors) 41 දෙනෙකු සහ දිස්ත්‍රික් ප්‍රධාන පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (Chief Public Health Inspectors) 10 දෙනෙකු සඳහා පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ වූ වැරදි සඳහා නඩු පැවරීමට හා නඩු කටයුතු මෙහෙයවීමට බලය පවරා ඇතත් එකී නිලධාරීන්ගේ සක්‍රිය දායකත්වය ලබාගැනීම සඳහා අවශ්‍ය නිසි සම්බන්ධීකරණය පළාත් හෝ ප්‍රාදේශීය මට්ටමින් සිදු වී නොමැති බව මා වෙත වාර්තා වී ඇත. එබැවින්, උක්ත නිලධාරීන් සමඟ නිල සබඳතා ඇති කර ගැනීම උදෙසා පළාත් හෝ ප්‍රාදේශීය මට්ටමින් බලයලත් නිලධාරීවරුන් (Authorized Officers) සහ නඩු පැවරීමට සහ නඩු කටයුතු මෙහෙයවීමට බලයලත් නිලධාරී (Officers Authorized to Institute

Proceedings & Conduct Prosecutions) හමු පැවැත්විම සුදුසු බව නැවත වරක් යෝජනා කරන අතර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**03**. උක්ත පනත යටතේ වූ වැරදි සඳහා නඩු පැවරීමට සහ නඩු කටයුතු මෙහෙයවීමට බලයලත් නැනැත්තන් වශයෙන් නම් කර ඇති සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් පෙර ක්‍රියාත්මක ක්‍රමවේදය පරිදි ප්‍රදේශයේ පළිබෝධනාශක බලයළත් නිලධාරියා සම්බන්ධීකරණ නිලධාරියා ලෙස නවදුරටත් කටයුතු කළ යුතු වේ.

ආචාර්ය ජේ.ඒ. සුමිත්
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්

පිටපත්:

1. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ස.
2. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (පාරිසරික සහ වෘත්තිය සෞඛ්‍ය සහ ආහාර ස්වස්ථතා) - කා.දැ.ස.
3. අධ්‍යක්ෂ (බි.ස.පැ.සං.) - කා.දැ.ස.
4. සියළුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් - කා.දැ.ස.
5. අභ්‍යන්තර විගණක - කා.දැ.ස.
6. එස්.එන්.එල්. රත්නවීර මහතා (ස.කෘ.අ.) - කා.දැ.ස. අවශ්‍ය සම්බන්ධීකරණය සහ පසුවිපරම් සිදුකිරීම සඳහා